

විශේෂ නිවේදනයයි

කොන්සියුලර් සේවා සැපයිම සීමාකිරීමයි.

දකුණු කොරියාව තුළ කොරෝනා වෛරස් ව්‍යාප්තියේ නැවත හිස එසවීමත් සමඟ පොදු ජන රැස්වීම් සහ වෙනත් එක්රැස්වීම් අවම කරමින් වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා කොරියානු රජය ගෙනයන වැඩපිළිවෙළට සහය දැක්වීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහත ක්‍රියාමාර්ගයන් අනුගමනය කරනු ලැබේ.

මේ අනුව, නැවත දැනුම් දෙන තෙක්, දකුණු කොරියාව තුළ ජීවත් වන ශ්‍රී ලාංකික ප්‍රජාව කොන්සියුලර් සහ රැකියා සුබසාධන සේවාවන් ලබා ගැනීමට සෝල් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පැමිණීම අවම කිරීමට ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව ඔබට කොන්සියුලර් සහ වෙනත් රැකියා සහ සුබසාධන අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පැමිණීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අදාළ අංශය විමසා <u>කලින් වේලාවක් වෙන් කර ගැනීම සිදුකළ යුතුය</u>.

මීට අමතරව නැවත දැනුම් දෙන තෙක් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සෙනසුරාදා දිනයන්හිදී රාජකාරී කටයුතු සඳහා විවෘත නොකෙරෙනු ඇත.

ඔබගේ කොන්සියුලර් සහ රැකියා සුබසාධන අවශ්‍යතාවයන් සඳහා කලින් වේලාවක් වෙන්කර ගැනීමට සහ ඔබට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පහත දුරකතන ඔස්සේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඇමතිය හැකිය.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලයීය දුරකතන අංක පහත පරිදි වේ.

සඳුදා සිට සිකුරාදා දක්වා (පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා)

කොන්සියුලර් අංශය

02-735 2966
02-735 2967
02-794 2968

දිගු අංක - 201, 203 හෝ 205

සඳුදා සිට සිකුරාදා දක්වා (පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා)

රැකියා සහ සුබසාධන අංශය

02-735 2966
02-735 2967
02-794 2968

දිගු අංක - 301, 302, 309, 310 හෝ 311

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
සෝල්, දකුණු කොරියාව